සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>வணிகக் கல்வி II<br>Business Studies II | 32 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) (අ) ව්‍යාපාරයක අරමුණු **හතරක්** ලැයිස්තුගත කරන්න.

(ආ) "නිෂ්පාදිත, භාණ්ඩ හා සේවාවලට පමණක් සීමා නොවේ." නිෂ්පාදිත වශයෙන් සැලකිය හැකි භාණ්ඩ හා සේවා **නොවන** දෑ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණයට අනුව 'ළී බඩු' හා 'ශබ්දමාලාව' (Glossary) යන භාණ්ඩ අයත් වන වර්ගීකරණය වෙන වෙන ම දක්වන්න.

(ආ) ඉහත (ii) (අ)හි ඇති භාණ්ඩ දෙක ඔබ සඳහන් කළ වර්ගීකරණයන්ට අයත් වන්නේ ඇයි දැයි හේතු සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) පසුගිය වසර කිහිපය තුළ සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබුනු දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වීමට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) සමහර ව්‍යාපාර ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික අංශ තරගකාරීව ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින නමුත් පෞද්ගලික අංශයට වඩා රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලින් තම අවශ්‍යතා සපුරාගැනීමට ජනතාව පෙළඹීමට බලපාන කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීම, අවස්ථාවක් විය හැකි කර්මාන්තයක් හා තර්ජනයක් විය හැකි කර්මාන්තයක් බැගින් නම් කර, ඊට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(v) කිසියම් කර්මාන්තයක තරගකාරීත්වය වර්ධනය වීම, අදාළ කර්මාන්තයේ නියුතු ව්‍යාපාර ආයතනයක නිෂ්පාදිත හා මිල සම්බන්ධ තීරණවලට බලපාන ආකාර **දෙක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

2. (i) (අ) විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජයකට අනුගමනය කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම රජයක අරමුණකි. ඔබ, බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක නියුතු වී සිටින්නකු නම්, මෙම අරමුණ ඉටුකරලීමට ව්‍යාපාරිකයකු ලෙස ඔබට දායක විය හැකි ආකාර **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ආදායම් බදු හා එකතු කළ අගය මත අය කරන බදු (VAT) සංසන්දනය කරමින් ඒවා අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න.

(ආ) බැංකු ණය පොලී අනුපාත වැඩි කිරීම, දේපළ වෙළෙඳාම් (Real estate) ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාරිකයකුට බලපාන ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) "රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර ආයතන වර්ග අතුරෙන් රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථාවලට වඩා ව්‍යාපාර තරගකාරීත්වයට මුහුණ දීමට යෝග්‍ය වේ." මෙම ප්‍රකාශය තහවුරු කිරීමට කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ශ්‍රී ලංකාවේ 'සමුපකාර ව්‍යාපාරය' ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි හඳුනාගත හැකි ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) වරලත්හිමියකු විසින් වරලත්ලාභියකු තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) සනත් සහ පියල් යන දෙදෙනා ලිඛිත ගිවිසුමකින් තොරව රු. 100 000 බැගින් යොදා, ඖෂධ අලෙවි කිරීම සඳහා 'XY සහ සමාගම' නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. දී ඇති තොරතුරු පදනම් කරගෙන, ආරම්භ කිරීමට යන මෙම හවුල් ව්‍යාපාරයට අදාළ මූලික නෛතික පනත් **හතරක්** සඳහන් කර, ඒවා අදාළ වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ දෙවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

3. (i) "රටක සංවර්ධනයට වඩාත් අවශ්‍ය වන්නේ ව්‍යාපාරිකයින්ට වඩා ව්‍යවසායකයින් ය." මෙම ප්‍රකාශය, ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) අමල් කුඩා කළ සිට ම ව්‍යවසායකයකු වීමේ අදහසින් සිටි අයෙකි. නමුත් මූල්‍යමය වශයෙන් ශක්තිමත් නොවූ නිසා ඔහු සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි, අර්ධ අගනා මැණික් ගල් භාවිත කර විසිතුරු භාණ්ඩ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එය මේ වන විට දියුණු තත්ත්වයකට පත් වෙමින් තිබේ. මෙම සිද්ධියට අනුව ව්‍යවසායක ගති ලක්ෂණ **දෙකක්** හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) චෙක්පතක් රේඛනය කිරීම තුළින් අණකරුවකු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල අතර වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව (2016) ට අනුව ණය කාඩ්පත් භාවිතය රටෙහි මුළු ජනගහනයෙන් 6%කට ආසන්න ප්‍රමාණයකි.

(අ) ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය අඩු මට්ටමක පැවතීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ණය කාඩ්පත් භාවිතය වැඩි කිරීමට බැංකුකරුවකුට අනුගමනය කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) රටක විදේශ විනිමය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම එම රටෙහි විදේශ වෙළෙඳාමේ නියුතු ව්‍යාපාරවලට බලපාන ආකාර **දෙකක්** ලියන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල අධීක්ෂණ කටයුතු කිරීම, ගනුදෙනුකරුවන්ට හිතකර ලෙස බලපාන ආකාර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) පියසිරි විසින් දරුකමට හදාගනු ලැබූ වසන්ත වෙනුවෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණි. එහෙත් ළමා කාලයේ සිට පැවති රෝගයකින් වයස අවුරුදු 26 දී වසන්ත මිය ගියේ ය. පියසිරි විසින් වසන්තගේ ජීවිත රක්ෂණ ඔප්පුවට වන්දි ලබා ගැනීමට යෑමේ දී ඇතිවිය හැකි ගැටලු **දෙකක්** රක්ෂණ මූලධර්ම පදනම් කරගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) 'මහජන වගකීම් රක්ෂණය' යනු කුමක් දැයි විස්තර කර ඊට නිදසුනක් සපයන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ආයතනයක් විසින් සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) ගෝලීය තැන් සෙවුම් පද්ධතිය (Global Positioning System - GPS) භාවිත කිරීම මගින් භාණ්ඩ ප්‍රවාහනයේ දී ව්‍යාපාරිකයකුට ඇති වන වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iii) සිල්ලර වෙළෙඳ ක්ෂේත්‍රය තුළ සුපිරි වෙළෙඳසැල් ක්‍රමය ජනප්‍රිය වුව ද සාම්ප්‍රදායික සිල්ලර අලෙවිසැල් ද බහුලව පැවතීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) "භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියේ දී තොග වෙළෙන්දා අත්‍යවශ්‍ය පාර්ශ්වකරුවෙකි." මෙම අදහසට පක්ෂව හා විපක්ෂව කරුණු **දෙක** බැගින් සඳහන් කරන්න.

(ආ) 'පොදු වරණීය තීරුබදු සහනය +' (Generalized System of Preference - GSP+) යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 04 යි)

(v) (අ) විද්‍යුත් වෙළෙඳාමක් සිදු වන ආකාරයට අයත් පියවර ලැයිස්තුගත කරන්න.

(ආ) විද්‍යුත් ව්‍යාපාර (e-business) හා විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) අතර වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

5. (i) (අ) "නිවැරදි දෙයක් නිවැරදි ආකාරයට කිරීම" කළමනාකරණය ලෙස පීටර් ඩ්‍රකර් විසින් දක්වා ඇත. මෙම අදහසේ අඩංගු කළමනාකරණ මූලිකාංග **දෙක** සඳහන් කරන්න.

(ආ) හෙන්රි මින්ට්ස්බර්ග් විසින් විස්තර කළ, කළමනාකරුවකුගේ තීරණ ගැනීමේ භූමිකාවට අයත් උප භූමිකා **හතර** නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) පාලන විතස්ථිය (පාලන අවකාශය) තීරණය කිරීමට බලපාන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(ආ) ආයතනයක සංවිධාන සටහන පිරමීඩාකාර හැඩයක් ගැනීමෙන් විදහා දැක්වෙන කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාරික ආයතනයක අරමුණුවල (Objectives) මූලික ගුණාංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර මොනවා ද?

(ආ) මෙහෙවර ප්‍රකාශයක අන්තර්ගත විය යුතු මූලිකාංග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) සැලසුම්කරණ ක්‍රියාවලියේ දී දැකිය හැකි ප්‍රායෝගික ගැටලු **හතරක්** ලියන්න.

(ආ) "සංවිධානයක ඉහළ මට්ටමේ කළමනාකරුවන්ට සෙසු කළමනාකරණ මට්ටම්වලට වඩා වැඩියෙන් සංකල්පනාත්මක කුසලතා තිබිය යුතු වේ." මෙම අදහසට පක්ෂව කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ තුන්වැනි පිටුව බලන්න.

6. (i) සංවිධානකරණයේ දී සිදුවිය හැකි දුර්වලතා **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) නෛතික බලය හැර කළමනාකරුවකුට බලය ලැබෙන වෙනත් මූලාශ්‍ර **හතරක්** නම් කර, ඉන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව හා නිර්බාධවාදී නායකත්ව ශෛලීන් අතර සමානකම් **දෙකක්** ලියන්න.
(ආ) වැඩබිම් මට්ටමේ (Floor-level) සේවකයින් අභිප්‍රේරණය කිරීම සඳහා ව්‍යාපාරයකට යොදා ගත හැකි ක්‍රම **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ආයතනයක, අවිධිමත් සන්නිවේදනයේ වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න.
(ආ) සංවිධාන ධූරාවලියේ ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය දක්වාත්, පහළ කළමනාකරණයේ සිට ඉහළ කළමනාකරණය දක්වාත් සන්නිවේදනය කෙරෙන තොරතුරු වර්ග **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(v) ගොඩනැගිලි ඉදිකරන්නකු වූ කමල්, කලින් කළ ඉදිකිරීම් ව්‍යාපෘතිවලදී ගොඩනැගිලි ද්‍රව්‍ය අපතේ ගිය බවත්, නියමිත වේලාවට ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වූ බවත් හඳුනාගෙන ඇත. ඉදිරි ව්‍යාපෘතිවලදී ද්‍රව්‍ය අපතේ යාම අඩුකර ගැනීමට හා නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට කමල්ට අනුගමනය කළ හැකි පාලන ක්‍රම **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

7. (i) නිෂ්පාදිතයක මට්ටම් පහ අතුරෙන් ඕනෑ ම මට්ටම් **හතරක්**, ජංගම දුරකථන නිදසුනක් ලෙස ගෙන විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී එහි යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි පරීක්ෂණ (ක්ෂේත්‍ර) **හතරක්** සඳහන් කරන්න.
(ආ) සඵලදායී හුවමාරුවක් සිදුවීමට සපුරාගත යුතු කොන්දේසි **හතරක්** ලැයිස්තුගත කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'පෑන්' සහ 'ඇස් කණ්ණාඩි' යන භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීමට වඩාත් යෝග්‍ය නිෂ්පාදන ක්‍රම (Production methods) සඳහන් කර, ඊට හේතු දක්වන්න.
(ආ) නිෂ්පාදන කර්මාන්ත ආයතනයක නිෂ්පාදන පිරියත නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) පසුගිය වසර කිහිපය තුළ ආයතනයක මෙහෙයුම් ආදායම ක්‍රමයෙන් අඩු වන තත්ත්වයක් පෙන්වයි. මෙම ආයතනයට මෙහෙයුම් ආදායම වැඩි කර ගැනීමට භාවිත කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) සීමාසහිත පොදු සමාගමක බාහිර අරමුදල් සම්පාදන මාර්ග **දෙකක්** නම් කර, ඒවායෙහි වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) ලිපිකරුවන් බඳවා ගැනීම සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් කැඳවීම තුළින් ආයතනයකට ඇති විය හැකි වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) මාස හයක පරිවාස කාලයකට යටත්ව මීට මාස පහකට පෙර නිමාලි, කළමනාකරණ සහකාරවරියක වශයෙන් ABC ආයතනයට බැඳුනා ය. ඇයගේ වැඩවල ගුණත්වය පිළිබඳ කළමනාකරණය සෑහීමකට පත් වී නොමැති නිසා නිමාලි පිළිබඳව කළමනාකරණයට ගත හැකි තීරණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) තොරතුරු පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා ව්‍යාපාරයකට භාවිත කළ හැකි ආරක්ෂිත ක්‍රම **හතරක්** දක්වන්න.
(ආ) දත්ත හා තොරතුරු සංසන්දනය කරමින්, ඒවා අතර පවතින වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) ආයතනයක මෙහෙයුම් මට්ටමේ දී ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) භාවිත කළ හැකි කළමනාකරණ ශ්‍රිත **දෙකක්** නම් කර, ඒවාට අයත් ගනුදෙනු සැකසුම් පද්ධති **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(ආ) ව්‍යාපාර සැලැස්මක අංගයක් ලෙස මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

## I කොටස

01. (i) (අ) **ව්‍යාපාරයක අරමුණු**

1. වෙළෙඳපොළ තුළ රැඳී සිටීම / අඛණ්ඩ පැවැත්ම
2. වෙළෙඳපොළ කොටස වැඩි කිරීම.
3. ව්‍යාපාරයේ ප්‍රතිරූපය හා කීර්තිනාමය වර්ධනය කිරීම.
4. ලාභය උපරිම කිරීම.
5. තරගකාරීත්වය වර්ධනය කිරීම / තරගයට මුහුණ දීම.
6. විකුණුම් උපරිම කිරීම.
7. කොටසක අගය වැඩිකර ගැනීම.
8. වෙළෙඳපොළ පුළුල්කර ගැනීම.
9. සමාජ වගකීම් ඉටු කිරීම.
10. ගුණත්ව නායකත්වය ලබා ගැනීම.
11. නිෂ්පාදන ඵලදායකත්වය වැඩිකර ගැනීම.

(ආ) **භාණ්ඩ තොගවන දෑ**

1. අදහස්
2. ඉසව් / ක්‍රියාකාරකම්
3. පුද්ගලයන්
4. සංවිධාන
5. දේපළ
6. තොරතුරු
7. අත්දැකීම්
8. ස්ථාන

(ii) (අ) * **ලී බඩු** - සාප්පු භාණ්ඩ  * **ශබ්දමාලාව** - නොසෙවූ භාණ්ඩ

(ආ) **ලී බඩු**

සාප්පු භාණ්ඩ නිතර නිතර මිල දී නොගනී. එමෙන් ම මේවායේ මිල, ගුණත්වය, කල් පැවැත්ම එකිනෙකට වෙනස් ය. එහෙයින් මේවා මිල දී ගැනීමට පාරිභෝගිකයා කාලය හා ශ්‍රමය වැය කරයි. ලී බඩුවල මෙම ලක්ෂණ පවතින නිසා එය සාප්පු භාණ්ඩයකි.

**ශබ්දමාලාව**

නොසෙවූ භාණ්ඩ යනු මෙතෙක් මිල දී ගැනීමට කැමැත්තක් හෝ රුචිකත්වයක් ඇති වී නොමැති භාණ්ඩයි. එමෙන් ම වෙළෙඳපොළේ පවතින බව නොදත් භාණ්ඩයි. ශබ්දමාලාව මූලික වශයෙන් විශේෂ අවශ්‍යතාවයක් ඉටු කරයි. එය නිතර නිතර අවශ්‍ය නොවේ. ප්‍රචාරණයක් හා ප්‍රවර්ධනයක් ද නොමැත. මිල දී ගත හැකි ස්ථාන සීමිත ය. එමනිසා ශබ්ද මාලාව නොසෙවූ භාණ්ඩ ගණයට අයත් වේ.

(iii) (අ)

1. ශ්‍රී ලංකාවේ මුදල් අගය අවප්‍රමාණය වීම.
2. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
3. සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව ආයෝජන ඉහළ යාම.
4. සාමකාමී වාතාවරණයක් පැවතීම.
5. කලාපීය රටවල අර්බුදකාරී තත්ත්වයන් ඇති වීම.
6. කලාපීය රටවල ආර්ථික දියුණුව
7. විදේශ රටවල් සමඟ ශ්‍රී ලංකා රජය යහපත් සම්බන්ධතා ඇතිකර ගැනීම.
8. සංචාරක කර්මාන්තය සම්බන්ධ ව ජාත්‍යන්තර ප්‍රවර්ධනය සාර්ථක වීම - විශේෂයෙන් චීනයේ

(ආ)

1. විශ්වාසය
2. පළපුරුදු හා සුදුසුකම් සහිත සේවකයන් සිටින බව විශ්වාස කිරීම.
3. ලැදියාව
4. මිල අඩු බව විශ්වාස කිරීම.
5. වංචා රහිත යැයි විශ්වාස කිරීම.
6. ආයතන සංස්කෘතිය
7. ගනුදෙනුකරුවන් තුළ ඇති පුරුදු

1. **විශ්වාසය**

රජයක වගකීම අනන්ත වේ. රජයකට ස්වකීය වගකීමෙන් මිදිය නොහැකි ය. එමනිසා ජනතාව පෞද්ගලික අංශයට වඩා රාජ්‍ය අංශය කෙරෙහි විශ්වාසය පළ කරයි.

උදා :- රජයේ බැංකුවල මුදල් තැන්පත් කිරීම.

2. **පළපුරුදු හා සුදුසුකම් සහිත සේවකයින් සිටින බව විශ්වාස කිරීම.**

රජයට සේවකයින් බඳවා ගනුයේ විධිමත් ක්‍රමවේදයකට අනුව, ලිඛිත විභාග පවත්වා, සම්මුඛ පරීක්ෂණවලට කැඳවා ඉන් අනතුරු ව ය. එමනිසා පළපුරුදු හා සුදුසුකම් සහිත සේවකයින් රාජ්‍ය අංශය තුළ සිටිතැයි ජනතාව විශ්වාස කරයි.

3. **ලැදියාව**

රජය යනු ජනතාවයි. රජයේ ව්‍යාපාරවලින් උපයන ලාභ ජනතාව සතු වේ. එමනිසා රාජ්‍ය අංශයේ ව්‍යාපාර තමන්ගේය යන හැඟීමක් ජනතාව තුළ පවතී. එබැවින් ජනතාව රාජ්‍ය අංශයේ ව්‍යාපාර කෙරෙහි ලැදියාවක් දක්වයි.

4. **මිල අඩු බව විශ්වාස කිරීම.**

පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල අරමුණ ලාභ ඉපයීමයි. නමුත් රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල අරමුණ ජනතා සුබ සාධනයයි. එමනිසා රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල මිල අඩු බව ජනතාව විශ්වාස කරයි.

උදා :- ස.තො.ස. / රාජ්‍ය ඔසුසල නීතිගත සංස්ථාව

5. **වංචා රහිත යැයි විශ්වාස කිරීම.**
රජය කටයුතු කරනුයේ ජනතාව වෙනුවෙනි. ජනතාවගේ යහපත වෙනුවෙනි. එමනිසා රාජ්‍ය අංශයේ ව්‍යාපාර ජනතාවට වංචා නොකරයි යන අදහස ජනතාව තුළ පවතී.

(iv) අවස්ථා

1. **සෞඛ්‍ය සේවා**
වයස්ගත ජනගහනය වැඩිවන විට සෞඛ්‍ය පිරිහීම වැඩිවන නිසා විවිධ රෝග ඉස්මතු වේ. එමනිසා සෞඛ්‍ය සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළ යයි.

2. **වැඩිහිටි සුරැකුම් හා සාත්තු සේවා**
වයස්ගත ජනගහනය වැඩිවන විට ඔවුන් ව රැකබලා ගැනීමේ ගැටලු මතු වේ. එමනිසා වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන වෙත තම වැඩිහිටියන් ව යොමු කිරීමට සමාජය පෙළඹී ඇත. එසේ නැතහොත් නිවෙස්වලට ම සාත්තු සේවකයින් ගෙන්වා වැඩිහිටියන් බලා ගැනීමට සලස්වයි. එමනිසා එවැනි ව්‍යාපාර සඳහා වෙළෙඳපළ අවස්ථා මතු වේ.

තර්ජන

1. **අධ්‍යාපන**
බොහෝ අධ්‍යාපන පාඨමාලාවල ඉලක්ක වෙළෙඳපළ තරුණ පරම්පරාව වේ. වයස්ගත ජනගහනය වැඩි වීම බලපාන තර්ජනයකි.

2. **රක්ෂණ කර්මාන්ත**
තරුණ පිරිස් රක්ෂණය වූ විට දිගු කාලීන ජීවිත රක්ෂණ ඔප්පු අලෙවි කළ හැකි අතර, විශාල කාලයක් වාරික මුදල් අයකළ හැකි ය. නමුත් වැඩිහිටි ජනගහනය වැඩිවන විට එය අපහසු වේ. වැඩිහිටි රක්ෂණ ඔප්පු හඳුන්වා දුන්න ද රක්ෂණ ආයතනවලට ප්‍රතිලාභ අඩු වේ.

(v) **නිෂ්පාදිත සම්බන්ධ ව**

1. ගුණත්වය වැඩි කිරීමට සිදු වීම.
2. නවෝත්පාදන ඇති කිරීමට සිදු වීම.
3. **ප්‍රතිලාභ වැඩි කිරීමට සිදු වීම.**
4. නව උපාංග එකතු කිරීමට සිදු වීම.
5. **අඛණ්ඩ ව සංවර්ධනය කළ යුතු වීම.**
6. ප්‍රමිතීන් ස්ථාපිත කිරීමට සිදු වීම / ප්‍රමිතීන්ට අනුගත වීම.

**මිල සම්බන්ධ ව**

1. මිලෙහි වෙනස්කම් කිරීමට සිදු වීම.
2. වට්ටම් හා දීමනා ලබා දීමට සිදු වීම.
3. පහසු ගෙවීමේ ක්‍රම හඳුන්වා දීමට සිදු වීම.

02. (i) (අ)
1. **නීතිරීති ලිහිල් කිරීම.**
2. **විනිමය ප්‍රතිපත්ති ලිහිල් කිරීම.**
3. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
4. නිදහස් වෙළෙඳ කලාප ඇති කිරීම.
5. බදු සහන හා බදු විරාම ලබා දීම.
6. විදේශීය ආයෝජන ප්‍රවර්ධනය
7. ආයෝජන හා වෙළෙඳ ගිවිසුම්වලට එළඹීම.
8. මධ්‍යස්ථ ජාත්‍යන්තර ප්‍රතිපත්ති මගින් ජාත්‍යන්තර සම්බන්ධතා ඇති කර ගැනීම.

(ආ)
1. **නිෂ්පාදනයට අදාළ ප්‍රමිති සහතික ලබා ගැනීම.**
පානීය ජල බෝතල් නිෂ්පාදනයට අදාළ ප්‍රමිති සහතික ලබා ගැනීම හා පවත්වාගෙන යාම. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගෙන කටයුතු කිරීම.

2. **අනුකරණවලින් ආරක්ෂා කර ගැනීම.**
කුට වෙළෙඳුන් අනුකරණ නිෂ්පාදිත වෙළෙඳපළට නිකුත් කිරීමේ ප්‍රවණතාවයක් පවතින බැවින් ඉන් පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමට, ව්‍යාජ අනුකරණ වැළැක්විය හැකි සේ බෝතලය, ලේබලය, ඇසුරුම නිර්මාණය කිරීම.

3. **අතරමැදියන්ට උපදෙස් ලබා දීම.**
ආරක්ෂා සහිත ව ප්‍රවාහනයට හා ගබඩා කිරීමට මෙන් ම පරිහරණය සඳහා අවශ්‍ය උපදෙස් අතරමැදියන්ට ලබා දීම.

4. **ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම.**
පානීය ජල බෝතල් සඳහා ජලය ලබා ගන්නා ජල මූලාශ්‍ර ආශ්‍රිත ව පිරිසිදු බව හා වනගහනය ආරක්ෂා කර ගැනීම.

5. **පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ සේවකයින් දැනුවත් කිරීම.**
පාරිභෝගිකයන්ට සේවය සැලසීමේ දී ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ ව ද සැලකිලිමත් වන ලෙස සේවකයන් ව දැනුවත් කිරීම.

(ii) (අ)

| **ආදායම් බදු** | **එකතු කළ අගය මත බදු** |
| --- | --- |
| සෘජු බද්දකි / විතැන් කළ නොහැකි ය. | වක්‍ර බද්දකි / විතැන් කළ හැකි ය. |
| ආදායම මත අය කෙරේ. | භාණ්ඩ හා සේවා වටිනාකම මත අය කෙරේ. |
| අනුක්‍රමික බද්දකි. | නිශ්චිත බදු අනුපාතයකි. |
| බදු ගණනයේ දී අනුමත සමහර වියදම් අඩු කළ හැකි ය. | ගෙවූ බදු ආපසු ලබාගත හැකි ය. |

(ආ)
1. විකුණුම් පහත වැටීම.
2. ප්‍රාග්ධන පිරිවැය ඉහළ යාම.
3. ව්‍යාපාරයේ ක්‍රියාකාරී පිරිවැය ඉහළ යාම. (මෙහෙයුම් පිරිවැය)
4. ලාභදායිත්වය අඩු වීම / ලාභාන්තිකය අඩු වීම.
5. ව්‍යාපාරයේ ආයෝජන අඩු වීම / ප්‍රති ආයෝජන අඩු වීම.

(iii)

1. **මූල්‍ය නිදහස / ප්‍රාග්ධනය සපයා ගැනීමේ නිදහස**

රාජ්‍ය සංස්ථා ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමේ දී රජයේ මූල්‍ය රෙගුලාසිවලට යටත්විය යුතු වේ. නමුත් රාජ්‍ය සමාගම්වලට එවැනි බලපෑම් නොමැත.

2. **තීරණ ගැනීමේ නිදහස**

රාජ්‍ය සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කළ ද තීරණ ගැනීමේ දී මූල්‍ය හා පරිපාලන නීති රීතිවලට යටත් වීමට සිදු වේ. නමුත් රාජ්‍ය සමාගම්වලට **ක්ෂණික** ව්‍යාපාරික **තීරණ** ගත හැකි ය.

3. **කළමනාකරණය පහසු වීම.**

රාජ්‍ය සංස්ථා, රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට යටත් වුව ද රාජ්‍ය සමාගම් ඊට යටත් නොවීම.

4. **සේවක ප්‍රතිලාභ නම්‍යශීලී ව ලබා දිය හැකි වීම.**

රාජ්‍ය සංස්ථා සේවකයින්ට වඩා වැඩි ප්‍රතිලාභ රාජ්‍ය සමාගම් සේවකයින්ට හිමි වේ. අධ්‍යක්ෂක තීරණ මත විවිධ **සේවක** අභිප්‍රේරණ **ක්‍රම** රාජ්‍ය සමාගම්වල ක්‍රියාත්මක වේ. එමනිසා දක්ෂ සේවකයින් රාජ්‍ය සමාගම්වලට බඳවාගත හැකි ය.

**දේශපාලන බලපෑම් අවම වීම.**

රාජ්‍ය සංස්ථාවල මුළුමනින් ම හෝ වැඩි අයිතියක් රජය සතු වේ. එමනිසා අනවශ්‍ය දේශපාලන බලපෑම්වලට ලක්වේ. නමුත් රාජ්‍ය සමාගම්, සමාගම් පනත යටතේ ලියාපදිංචි කර අරම්භ කරන බැවින් දේශපාලන බලපෑම් ඉවත් වේ.

(iv) (අ)
1. කළමනාකරණ දුර්වලතා ඇති වීම.
2. සාමාජික ප්‍රමාණය අඩු වීම.
3. ස්වාධීනත්වය පිරිහීම හා දේශපාලනීකරණය වීම.
4. ප්‍රාග්ධන සම්පාදනය අඩු වීම.
5. සුදුසුකම් නොමැති පුද්ගලයින් කළමනාකරණයට පත් වීම.
6. නිලධාරි පාලනයට යටත් වීම.

(ආ)
1. වරලත්ලාභියා පිළිබඳ ව ඇති විශ්වාසවන්ත බව
2. මූල්‍ය ශක්තීන්
3. වරලත්ලාභියාගේ ප්‍රතිරූපය හා කීර්තිනාමය
4. වෙනත් ශක්තීන්
5. වරලත්ලාභියාට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ ඇති දැනුම හා පළපුරුද්ද

(v)

1. **1890 හවුල් ව්‍යාපාර ආඥා පනත**

සනත් සහ පියල් ලිඛිත ගිවිසුමකින් තොර ව හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන නිසා හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය අනුව කටයුතු කිරීමට සිදු වේ.

2. **1840 අංක 07 දරන වංචා වැළැක්වීමේ ආඥා පනත**

මෙම පනත අනුව ආරම්භක ප්‍රාග්ධනය රු. 1000ට වඩා වැඩි නම්, ලිඛිත හවුල් ගිවිසුමක් පවත්වා ගත යුතු ය. මෙම හවුලේ ආරම්භක ප්‍රාග්ධනය රු. 100 000ක් බැවින් මෙම පනත බලපායි.

3. **1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත**

මෙම පනත අනුව හවුල්කරුවන්ගේ නම්වලින් හැර වෙනත් ව්‍යාජ නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යයි නම්, එම නාමය ලියාපදිංචි කළ යුතු ය. මෙම හවුල "XY සහ සමාගම" යන නම භාවිත කරන නිසා එම නාමය මෙම පනත යටතේ ලියාපදිංචි කළ යුතු ය.

4. **2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත (N.M.R.A.)**

ඖෂධ අලෙවි කිරීමේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන බැවින් මෙම පනත බලපානු ලබයි. (1980 අංක 27 දරන විලවුන් උපකරණ හා ඖෂධ පනත අහෝසි කර මෙම නව පනත ඉදිරිපත් කර ඇත.)

03. (i) **ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර පහත වෙනස්කම් දැකිය හැකි ය.**

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| 1. සාම්ප්‍රදායිකයි. | 1. වෙනස්වීම්වලට නැඹුරු ය. |
| 2. තිබෙන දෙයින් සෑහීමකට පත් වේ. | 2. නිර්මාණශීලී ව අවස්ථා හඹා යයි. |
| 3. සාපේක්ෂ ව අවදානම් මගහරියි. | 3. සාපේක්ෂ ව අවදානම් භාර ගනියි. |
| 4. සාම්ප්‍රදායික තීරණ ගනියි. | 4. නිර්මාණශීලී තීරණ ගනියි. |
| 5. තරගකාරීත්වයට කැමති නැත. | 5. තරගකාරීත්වයට කැමති ය. |
| 6. කෙටිකාලීන ඉලක්ක ඇති කර ගනියි. | 6. දිගුකාලීන ඉලක්ක ඇති කර ගනියි. |
| 7. පවතින දැනුම මත යැපේ. | 7. අඛණ්ඩ ව නව දැනුම සොයා යයි. |

වර්තමාන ව්‍යාපාර පරිසරය ගතික ය, එමෙන් ම තරගකාරී සහ දැඩි ලෙස විචලනයට ලක් වේ. තව ද වර්තමාන ව්‍යාපාර පරිසරය ගෝලීයකරණයට ලක්වූවකි. එවැනි පරිසරයක් තුළ සාර්ථක ව ක්‍රියාත්මක වී රටක සංවර්ධනයට දායක වීමට ව්‍යාපාරික ලක්ෂණවලට වඩා ව්‍යවසායකත්ව ලක්ෂණ වැදගත් වේ. ව්‍යවසායකයා නව නිර්මාණ බිහි කරයි, ජාතික නිෂ්පාදනය වැඩි කරයි, රැකියා බිහි කරයි, දේශීය සම්පත් භාවිත කරයි, විදේශ විනිමය උපයයි. එමනිසා රටක සංවර්ධනයට ව්‍යාපාරිකයන්ට වඩා ව්‍යවසායකයින් අවශ්‍ය වේ. ඔවුන් රටක් පවත්නා තත්ත්වයෙන් ඉදිරියට ගෙනයන්නෝ වේ.

(ii) 1. **අධිෂ්ඨානශීලී බව**

ඉලක්ක සපුරා ගැනීමට නොපසුබට ව ක්‍රියා කිරීමේ ගුණාංගයයි. අමල් කුඩා කල සිට ම පැවති ව්‍යවසායකයකු වීමේ අදහස මුදුන්පත් කර ගත් හෙයින් මෙම ගති ලක්ෂණය ඔහු සතු ව ඇත.

2. **නිර්මාණශීලී බව**

අලුත් දෙයක් කිරීමේ හැකියාවයි. අමල් වටිනාකමින් අඩු මැණික් ගල් භාවිත කර විසිතුරු භාණ්ඩ නිපදවීම අලුත් අදහසකි. නව දේ කිරීමට සිතීමකි.

3. **ආත්ම විශ්වාසය**

ව්‍යවසායකයා තමා ගැන විශ්වාසයෙන් යුතු ව කටයුතු කිරීමයි. මූල්‍යමය වශයෙන් ශක්තිමත් නොවුව ද තමන්ට ව්‍යාපාරයක් කළ හැකි බව අමල් විශ්වාස කිරීම.

4. **කැපවීම හා උනන්දුව**

කායික හා මානසික ශ්‍රමය වෙහෙසා වැඩ කිරීමට ආශා කිරීමයි. අමල්ගේ ව්‍යාපාරය මේ වන විට දියුණු තත්ත්වයට පත් ව ඇත්තේ ඔහුගේ උනන්දුව හා කැපවීම නිසා ය.

5. **අවස්ථා හඳුනාගැනීම සහ ක්‍රියාවට නැංවීම.**

බොහෝ පුද්ගලයින් අවස්ථා හඳුනාගත්ත ද එය ක්‍රියාවට නංවා ව්‍යවසායකයකු බවට පත් නොවේ. නමුත් අමල් අර්ධ අගනා මැණික් ගල් භාවිත කර විසිතුරු භාණ්ඩ නිපදවීමේ ව්‍යාපාර අවස්ථාව හඳුනාගෙන එය ක්‍රියාවට ද නංවා ඇත.

6. **නොනැවතී කරගෙන යාම.**

සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ ව්‍යාපාරය වර්තමානය වන තෙක් පවත්වාගෙන යමින් දියුණුවට පත් කර ගැනීම.

(iii) (අ) 1. ආරක්ෂාව ලබා ගැනීම / කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැළැක්වීම.
2. චෙක්පතට මුදල් ලබා ගන්නා පුද්ගලයා කවුරුන් ද'යි හඳුනාගත හැකි වීම.
3. ආදායකයාගේ ගිණුමට පමණක් යැ'යි සඳහන් කරමින් රේඛනය කර ඇත්නම් චෙක්පත හුවමාරුව සීමා කිරීම.
4. ගෙවීම පමා කිරීම.

(ආ)

| සේවක අර්ථසාධක අරමුදල | සේවක භාරකාර අරමුදල |
|---|---|
| 1. සේවා - සේවක යන පාර්ශ්ව දෙක ම දායක වේ. | 1. සේවායා පමණක් දායක වේ. |
| 2. විදේශ හා ස්වයං රැකියා නියුක්තිකයන්ට සාමාජිකත්වය ලබා ගත නොහැකි ය. | 2. විදේශ හා ස්වයං රැකියා නියුක්තිකයන්ට ද සාමාජිකත්වය ලබා ගත හැකි ය. |
| 3. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වාගෙන යයි. | 3. භාරකාර මණ්ඩලයක් මගින් පාලනය කරයි. |
| 4. කාන්තාවන් විවාහය මත රැකියාවෙන් ඉවත් වීම, විශ්‍රාම යාම, රට හැර යාම, විශ්‍රාම වැටුප් සහිත රැකියාවකට යාම යන කරුණු මත අරමුදල් ආපසු ලබාගත හැකි ය. | 4. රැකියාවෙන් ඉවත් වූ විට අරමුදලේ මුදල් ආපසු ලබාගත හැකි ය. |
| 5. පොලියට අමතර ව සීමිත ප්‍රතිලාභ හිමි වේ. | 5. පොලියට අමතර ව වැඩි ප්‍රතිලාභ අත් වේ. |
| 6. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පාලනය වේ. | 6. 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත යටතේ පාලනය වේ. |

(iv) (අ) 1. ණයගැතියෙකු වීමට ඇති අකමැත්ත
2. ගනුදෙනුවල විශ්වාසය පිළිබඳ සැක මතු වීම.
3. ජනතාවගේ දැනුවත් බව අඩු වීම.
4. අනවශ්‍ය වියදම් පාලනය කිරීමට ඇති කැමැත්ත
5. නියමිත කාලය ඉකුත් වූ විට ඉහළ පොලියක් අය කිරීම.
6. භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් රට පුරා ඒකාකාරී ව ව්‍යාප්ත නොවීම.
7. ණය කාඩ්පත් ලබා ගැනීමට සුදුසුකම් ලබා ගැනීමේ බැංකු කොන්දේසි නිසා

(ආ) 1. ජනතාවගේ දැනුවත් බව වැඩි කිරීම.
2. බැංකුව අය කරන විවිධ ගාස්තු අඩු කිරීම.
3. ආකර්ශනීය දිරිගැන්වීමේ ක්‍රම භාවිතය
4. වංචා වැළැක්වීම සඳහා ආරක්ෂිත ක්‍රම හඳුන්වා දීම.
5. විවිධ පාරිභෝගික ඛණ්ඩනවලට ගැළපෙන පරිදි කාඩ්පත් විවිධාංගීකරණය
6. ව්‍යාපාරික ආයතන සමඟ ගිවිසුම්ගත වීම හා ජාල සම්බන්ධතා ඇති කර ගැනීම.

(v) (අ) 1. විදේශ මුදල් සංක්‍රමණ පහසු වීම.
2. විදේශ වෙළෙඳ කටයුතු පහසු වීම.
3. විදේශ ව්‍යාපාරිකයින් සමඟ සාමූහික වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම පහසු වීම.
4. නව ව්‍යාපාර පැමිණීම නිසා ජාත්‍යන්තර තරගකාරීත්වය වැඩි වීම.

(ආ) 1. **තැන්පතුවල සුරක්ෂිතභාවය ඉහළ යාම.**
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ආයෝජනය කළ යුතු බැවින් තැන්පතුවලට ආරක්ෂාවක් සැලසේ.

2. **තැන්පතු සඳහා ප්‍රතිලාභ තහවුරු වීම.**
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සඳහා හිමි පොලිය ලැබෙන බව තහවුරු වීමයි. ඇතැම් මූල්‍ය ආයතන ඉහළ පොලියක් දෙන බව සඳහන් කළ ද එසේ පොලී නොලැබීමෙන් තැන්පතුකරුවන් අපහසුතාවයට පත් වේ. නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව අධීක්ෂණය කරන ආයතන ගනුදෙනුකරුවන්ට නිසි ලෙස ප්‍රතිලාභ හිමි කර දේ.

3. **ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ඉහළ යාම.**
මූල්‍ය ආයතන සමඟ කටයුතු කරන ගනුදෙනුකරුවන් ප්‍රතිලාභය හැරුණු විට සලකා බලන ප්‍රධාන සාධකයක් වනුයේ විශ්වාසවන්තභාවයයි. පසුගිය දිනවල රටේ ඇතැම් මූල්‍ය ආයතනවල ඇති වූ අර්බුදවලට ප්‍රධාන හේතුවක් වූයේ ඒවා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයෙන් තොර වීමයි.

4. **ආයෝජන හා ඉතිරිකිරීම් විකල්ප ලැබීම.**
වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන ශ්‍රී ලංකා මහ බැංකුව අධීක්ෂණය කරන නිසා එම **ආයතන තරගකාරී** ව හඳුන්වා දෙන විවිධ ඉතිරිකිරීම් ගිණුම් හා වෙනත් ආයෝජන මාර්ගවල මුදල් යෙදවීමට ගනුදෙනුකරුවන්ට අවස්ථාව ලැබේ.

04. (i) (අ) 1. **රක්ෂණ හිමිකම**
එනම් පියසිරිට නීත්‍යානුකූල ලියවිල්ලකින්, වසන්ත ව දරුකමට හදා ගැනීම සඳහා පැවරී තිබිය යුතු වීම. එසේ නීත්‍යානුකූල ව පැවරූ ලියවිල්ලක් ඉදිරිපත් නොකර වන්දි ලබා ගැනීමට හිමිකම් පෑ නොහැකි ය.

2. **උපරිම විශ්වාසය**
ඉහත සිද්ධියේ වසන්ත මිය යනුයේ ළමා කාලයේ සිට පැවති රෝගයකිනි. එමනිසා රක්ෂණ ඔප්පුව ලබා ගැනීමේ දී ද එම රෝගී තත්ත්වය පිළිබඳ ව නොසඟවා ඉදිරිපත් කළ යුතු ය. උපරිම විශ්වාසය මූලධර්මය යටතේ රක්ෂණ ඔප්පුවට අදාළ සියලු ම තොරතුරු නොසඟවා ඉදිරිපත් කළ යුතු ය. උපරිම විශ්වාසය කඩ වී ඇත්නම් වන්දි නොලැබේ.

(ආ) ව්‍යාපාර කටයුතු හේතුවෙන් මහජනයාට සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණය, **මහජන වගකීම් රක්ෂණය වේ.**
උදා :- ආහාරපාන විෂ වීම.
ගනුදෙනුකරුවකු මතට ගොඩනැගිල්ලක කොටසක් කඩා වැටීමෙන් වන අනතුරු සඳහා ආවරණය සැලසීම.

(ii) (අ) 1. පිරිවැය
2. තරගකරුවන් භාවිත කරන මාධ්‍යයන්
3. ආවරණය
4. පණිවුඩයට ගැළපීම.
5. සන්නිවේදනය කළ යුතු ග්‍රාහක පිරිස
6. වේගය
7. භාවිතයේ පහසුව
8. විශ්වාසවන්තභාවය

(ආ) 1. ළඟාවිය හැකි කෙටි ම මාර්ගය හඳුනාගත හැකි වීම.
2. පිරිවැය තීරණය කළ හැකි වීම.
3. අදාළ දුර ප්‍රමාණය දැනගත හැකි වීම / කාලය දැනගත හැකි ය.
4. අදාළ ස්ථානයන්හි පිහිටීම පිළිබඳ ව අවබෝධයක් ලැබීම.
5. තම ආයතනයේ වාහන ධාවනයේ දී දැනට තිබෙන ස්ථානය පිළිබඳ ව දැනගත හැකි වීම.

(iii) 1. ණයට භාණ්ඩ ලබාගත හැකි වීම. 2. අවශ්‍ය වේලාවට ළඟාවිය හැකි වීම.
3. ඉතා කුඩා ප්‍රමාණයන්ගෙන් ලබාගත හැකි වීම. 4. භාණ්ඩ මිල කේවල් කළ හැකි වීම.
5. සිල්ලර වෙළෙඳසැල් ද නව තාක්ෂණය ආදේශනය කර තිබීම. 6. පහසුවෙන් ළඟාවිය හැකි වීම.
7. පෞද්ගලික සම්බන්ධතා නිසා (ගනුදෙනුකරු හා වෙළෙන්දන් අතර) 8. පාරිභෝගික විශ්වාසය
9. සිල්ලර වෙළෙඳසැල් නව අලෙවිකරණ හා ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීම. 10. නැවුම් භාණ්ඩ මිල දී ගත හැකි වීම.

(iv) (අ) **පක්ෂ ව** 1. භාණ්ඩ බෙදාහැරීම පහසු වීම.
2. භාණ්ඩ හඳුන්වාදීම පහසු වීම.
3. නිෂ්පාදකයන්ගේ කාර්යන් පහසු වීම.
4. වෙළෙඳපොළ තොරතුරු අදාළ පාර්ශ්වයන්ගෙන් ලබාගත හැකි වීම.
5. සිල්ලර වෙළෙන්දාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා අඩු කර ගත හැකි වීම. / සිල්ලර වෙළෙන්දාට විශාල වශයෙන් තොග පවත්වාගෙන යාමට අවශ්‍ය නොවීම.

**විපක්ෂ ව** 1. වෙළෙඳපොළේ අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇති විය හැකි වීම.
2. සමහරවිට භාණ්ඩවල නියම ගුණත්වය ආරක්ෂා නොවීම.
3. භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකි වීම.
4. කොන්දේසිවලට යටත් වීමට සිදුවීම.

(ආ) සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙනු ලබන තීරු බදු සහනයකි. GSP + වල දී මූලික ප්‍රතිලාභවලට අමතර ව තවත් විශේෂිත වූ ක්ෂේත්‍රවලට ප්‍රතිලාභ ලබා දේ. ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් GSP + සහනය ලැබෙන්නේ යුරෝපීය සංවිධානයට අයත් රටවල්වලිනි.

(v) (අ) 1. අන්තර්ජාලය ඔස්සේ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම.
2. වෙළෙඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම.
3. භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදු වීම.
4. ගනුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම.

(ආ) 1. විද්‍යුත් ව්‍යාපාර සඳහා සියලු ම ව්‍යාපාර කටයුතු අයත් වන අතර විද්‍යුත් වාණිජ්‍යයට අයත් වන්නේ මිල දී ගැනීම හා විකිණීම සම්බන්ධ ක්‍රියාකාරකම් පමණි.
2. විද්‍යුත් ව්‍යාපාර පුළුල් සංකල්පයක් වන අතර, විද්‍යුත් වාණිජ්‍යය ඉන් එකොටසක් පමණි.
3. සාපේක්ෂ ව විද්‍යුත් ව්‍යාපාර අභ්‍යන්තර නැඹුරුවක් ඇති අතර, විද්‍යුත් වෙළෙඳාම බාහිර නැඹුරුවක් ගනියි.

## II කොටස

05. (i) (අ) 1. **කාර්යක්ෂමතාවය** - නිවැරදි ආකාරයට කිරීම. 2. **සඵලදායකත්වය** - නිවැරදි දෙයක් කිරීම.
(ආ) 1. ව්‍යවසායකයකු ලෙස කටයුතු කිරීම. 2. බාධා පාලනය කරන්නෙකු ලෙස කටයුතු කිරීම.
3. සම්පත් වෙන්කර දෙන්නෙකු ලෙස කටයුතු කරම.
4. අදහස් හුවමාරු කරන්නා / කතිකා කරන්නා / කේවල් කරන්නා ලෙස කටයුතු කිරීම

(ii) (අ) 1. කාර්යයේ ස්වභාවය 2. ප්‍රධානියාගේ කුසලතා
3. යටත් සේවකයන්ගේ හැකියාව හා පලපුරුද්ද 4. සංවිධානයේ බලගැන්වීමේ ප්‍රතිපත්ති

(ආ) 1. විවිධ කළමනාකරණ මට්ටම් ඇති බව
2. අධිකාරිය ධුරාවලියක් ලෙස පවතින බව
3. විවිධ මට්ටම්වල කළමනාකරුවන්ට විවිධ කුසලතා අවශ්‍ය වන බව
4. සංවිධානයේ ඉහළ මට්ටමේ කළමනාකරුවන් ප්‍රමාණයට වඩා පහළ මට්ටමේ කළමනාකරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින බව

(iii) 1. **Specific - නිශ්චිත වීම.**
අරමුණ පැහැදිලි ප්‍රකාශයක් ලෙස ඉදිරිපත් විය යුතු වීමයි. එනම් විවිධ අර්ථ ගෙන දෙන්නක් නොවිය යුතු වීමයි.

2. **Mesurable - මැනිය හැකි වීම.**
නියමිත කාලයේ දී අදාළ අරමුණු ළඟා කර ගෙන ඇත් ද යන්න මැන බැලිය හැකි විය යුතු ය.

3. **Achievable / Agreed - ළඟාවිය හැකි බව**
ව්‍යාපාරයට ළඟා කර ගත හැකි පමණින් අරමුණු ඇති කර ගත යුතු ය. දැරිය නොහැකි අරමුණු ඇති නොකරගත යුතු ය.

4. **Realistic / Relevent - යථාර්ථවාදී බව / අදාළ බව**
ආයතනයේ දක්ම හා නිශ්චිතවට ගැළපෙන පරිදි අරමුණු ඇති කර ගැනීමයි.

5. **Time bound - නිශ්චිත කාලයක් සහිත වීම.**
අරමුණු කාලය හා සම්බන්ධ ප්‍රකාශනයක් ලෙස ගොඩනැගිය යුතු ය.

(iv) (අ) 1. ගැටලුව හඳුනා ගැනීම.
2. විකල්ප විසඳුම් ගොඩනැගීම.
3. විකල්ප ඇගයීම.
4. හොඳ ම විකල්පය තේරීම.
5. ක්‍රියාත්මක කිරීම.

(ආ) 1. ගනුදෙනුකරු කවුද යන්න
2 කුමන නිෂ්පාදිතයක් ඉදිරිපත් කරන්නේ ද යන්න
3. භූගෝලීය වෙළෙඳපොළ කුමක් ද යන්න
4. අපේක්ෂා කරන ඉපැයුම් හා වර්ධනය
5. හර අගනාකම්, විශ්වාස හා දර්ශනය
6. රඳා පැවැත්ම හා වර්ධනය
7. ජනතා ප්‍රතිරූපය
8. යොදා ගන්නා තාක්ෂණය
9. සේවකයින් ගැන දක්වන සැලකිල්ල

(v) (අ) 1. කාලීන හා නිවැරදි තොරතුරු යොදා නොගැනීම.
2. හැකියාව හා ධාරිතාව ඉක්මවා සැලසුම් සකස් කිරීම.
3. සැලසුම්කරණය පිළිබඳ ඇති විශ්වාසය අඩු වීම.
4. උනන්දුව හා කැපවීම ප්‍රමාණවත් නොවීම.
5. සැලසුම් සකස් කිරීමේ දක්ෂතා ඇති අය අඩුකම
6. පසුගිය උපනතීන් හා පවත්නා දත්ත මත සැලසුම් සකස් කිරීම.
7. සැලසුම් බලාපොරොත්තු ආකාරයෙන් ම ක්‍රියාත්මක වෙතැ'යි යන විශ්වාසය
8. සමස්ත කළමනාකරණ පද්ධතියට සැලසුම් සමෝධානික නොවීම.
9. ආයතනයේ සෑම මට්ටමක ම සේවකයන්ගේ සම්බන්ධය හා සහයෝගය නොලැබීම.

(ආ) සංවිධානයක අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳ ව ඇති අවබෝධය, ගැටලු තේරුම් ගැනීම හා විසඳීමේ හැකියාව, දූරදර්ශීභාවය වැනි තීක්ෂණ ව සිතීමේ හැකියාව සංකල්පනාත්මක කුසලතා වේ. මෙය වැඩි වශයෙන් ඉහළ මට්ටමේ කළමනාකරුවන්ට අවශ්‍ය වේ.

**පක්ෂ ව** 1. **සංවිධානයක සාංගමික අරමුණු නියම කිරීමට**
සංවිධානයක අරමුණු ඇති කරගනුයේ ඉහළ කළමනාකරණය වේ. ඒ සඳහා අභ්‍යන්තර හා බාහිර පරිසරය පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ. සමස්තය දැකීමට හැකි විය යුතු ය.

2. **උපාය මාර්ග ප්‍රතිපත්ති තීරණය කිරීමට**
සංකල්පනාත්මක කුසලතාව තුළින් අනාගතය දැක්මේ හැකියාව ලැබේ. එසේ අනාගතය ගැන මනසින් දකිමින් උපාය මාර්ග ප්‍රතිපත්ති තීරණ ගනුයේ ඉහළ කළමනාකරණය විසිනි.

3. **පරිසර විචල්‍යතාවලට නිර්මාණශීලී ව විසඳුම් සැපයීමට**
පරිසර වෙනස්කම්වලට සාර්ථක ව මුහුණ දීමට නම් පරිසරය මනා ව අවබෝධ කර ගැනීමේ හැකියාව අවශ්‍ය වේ. එය සංකල්පනාත්මක කුසලතාව තුළින් ලැබේ.

4. **සංවිධානයේ සියලු අංශ සමෝධානය කිරීමට**
සංවිධානයේ වෙන් වෙන් ව ඇති අංශ අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීමයි.

06. (i) 1. කාර්යන් නිවැරදි ලෙස හඳුනා නොගැනීම.
2. සමායෝජනය නිවැරදි ව සිදු නොකිරීම.
3. කාර්යන් නිවැරදි ව බෙදා නොහැරීම. එනම් දුර්වල ශ්‍රම විභජනය
4. අධිකාරිය හා වගකීම් සමාන නොවීම.
5. දෙපාර්තමේන්තුකරණය යෝග්‍ය ලෙස නොකිරීම.
6. අණ කිරීමේ ධූරාවලියෙහි සංකීර්ණ බව
7. අධිකාරිත්වය ප්‍රමාණවත් ව නොපැවරීම.
8. සම්පත් අවශ්‍යතාවය පරිදි බෙදා නොයෑම.
9. පාලන විතස්තිය (අවකාශය) යෝග්‍ය නොවීම.

(ii) 1. **විශේෂඥ බලය** - බලපෑම් කරන්නා තුළ අන් අය වෙත සතු නොවන කිසියම් විශේෂඥ දැනුමක් හෝ හැකියාවක් පැවතීම මගින් ජනිත වන්නා වූ බලය

2. **අනුහස් බලය / පෞරුෂත්ව බලය** - බලපෑම් කරන්නා සතු අන් අය ආකර්ෂණය කර ගත හැකි කිසියම් අනුහසක් පැවතීම මත ජනිත වන බලයයි. මෙමගින් අන් අයගේ ගරුත්වයට ලක්වෙයි.

3. **ත්‍යාග දීම සඳහා ඇති බලය** - අන් අය වෙත ත්‍යාග ලබා දීමට ඇති හැකියාව මත ජනිත වන්නා වූ බලයයි.

4. **දඬුවම් දීමට ඇති බලය** - අන් අය වෙත දඬුවම් දීමට බලපෑම් කරන්නාට ඇති හැකියාව මත ජනිත වන්නා වූ බලයයි.

5. **තොරතුරු බලය** - යම් තොරතුරක හිමිකාරිත්වය මත ලැබෙන බලයයි.

(iii) (අ) 1. තීරණ ගැනීමේ දී සහායකයන්ගේ සහභාගීත්වය ලබා ගනියි.
2. තීරණ ගැනීම සඳහා සහායකයින්ට නිදහස ලබා දේ.
3. සහායකයින් පිළිබඳ ව විශ්වාස කිරීම.
4. ත්‍යාග දීම / ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධ ව වැඩි අවධානය

(ආ) 1. වැඩි වැටුප් හා වේතන ගෙවීම.
2. ප්‍රසාද දීමනා ලබා දීම.
3. ණය පහසුකම් ලබා දීම.
4. ආයතනයේ නිෂ්පාදිත සහන මිලට ලබා දීම.
5. රැකියාවේ සුරක්ෂිත බව තහවුරු කිරීම.
6. විනෝද චාරිකා සංවිධානය
7. සේවය අගය කිරීම හා ප්‍රශංසා කිරීම.
8. තීරණ ගැනීමට සම්බන්ධ කර ගැනීම.
9. සෞඛ්‍ය පහසුකම්, නිවාස, ආහාරපාන, නිල ඇඳුම් වැනි සුබසාධක පහසුකම් සැපයීම.

(iv) (අ) වාසි - 1. ලබා ගැනීමට අපහසු සම්හර තොරතුරු ලබාගත හැකි වීම.
2. වැඩි පිරිවැයක් නොදරා තොරතුරු සන්නිවේදනය වීම.
3. වැඩි පිරිසකට ඉක්මනින් තොරතුරු සන්නිවේදනය වීම.
4. විධිමත් සන්නිවේදනයට වඩා විශ්වාස වීම හා ග්‍රහණය වීම.
5. පුද්ගල සම්බන්ධතා ශක්තිමත් වීම.

අවාසි - 1. අසත්‍ය තොරතුරු සන්නිවේදනය විය හැකි වීම.
2. විනය ගැටලු ඇති වීම.
3. ප්‍රතිරූපයට හානි සිදුවිය හැකි වීම.
4. පාලනය කළ නොහැකි වීම.
5. තොරතුරු විකෘති විය හැකි වීම.

(ආ) ඉහළ සිට පහළට
1. කළමනාකරණ තීරණ
2. කළමනාකරණ සැලසුම්
3. බලතල පැවරීම පිළිබඳ ව
4. වැඩ බෙදීම පිළිබඳ ව
5. අංශ අතර සමායෝජනය
6. ප්‍රශංසා හා අගය කිරීම

පහළ සිට ඉහළට
1. වැටුප් සම්බන්ධ කරුණු
2. සේවක දුක්ගැනවිලි
3. සේවක ගැටලු
4. රැකියාව පිළිබඳ ගැටලු
5. සේවක යෝජනා

(v) අපතය අඩු කර ගැනීමට
1. තොග පාලන ක්‍රම චවත්වාගෙන යාම.
2. ගුණාත්ව ප්‍රමිති අනුගමනය කිරීම.
3. තත්ත්ව පාලන ක්‍රම අනුගමනය කිරීම.
4. සේවක අධීක්ෂණ ක්‍රම අනුගමනය කිරීම.
5. සේවක දැනුවත් කිරීම.

නියමිත වේලාවට ව්‍යාපෘති නිම කිරීමට
1. කාලසටහන් සකස් කිරීම.
2. CPM - අවධි මාර්ග ක්‍රමය
3. නවීන තාක්ෂණය භාවිතය
4. සේවක දැනුවත් කිරීම
5. විචලනයන් ඒ අවස්ථාවේ දී ම නිවැරදි කිරීම.
6. PERT - ව්‍යාපෘති ඇගයීම හා විශ්ලේෂණය කිරීම.
7. නියමිත කාලයට අදාළ ක්‍රියාකාරකම් නිම කර තිබේ දැයි නියාමනය කිරීම.

07. (i) 1. **හර ප්‍රතිලාභ (මූලික ප්‍රතිලාභ)**
කිසියම් නිෂ්පාදිතයකින් පාරිභෝගිකයා බලාපොරොත්තු වන මූලික ම ප්‍රතිලාභයයි.
උදා :- ඇමතුම් දීම හා ලබා ගැනීම.

2. **මූලික නිෂ්පාදිතය**
හර ප්‍රතිලාභ ලැබෙන පරිදි මූලික අවශ්‍යතාවලින් සමන්විත ව නිෂ්පාදිතය ඉදිරිපත් කිරීමයි. මෙහි දී සිදුවන්නේ හර ප්‍රතිලාභයට අමතර ව තවත් හඳුනාගත් ප්‍රයෝජන ඇතුළත් කර භාණ්ඩය නිර්මාණය කිරීමයි.
උදා :- යතුරු පුවරුව හා පැහැදිලි ශබ්දය

3. **අපේක්ෂිත නිෂ්පාදිතය**
ගැනුම්කරු ආකර්ෂණය කර ගැනීමට හැකිවන සේ අපේක්ෂිත ආකාරයට අවශේෂ අංගවලින් යුක්ත ව නිෂ්පාදිත ඉදිරිපත් කිරීමයි.
උදා :- බලපුවත්, කැමරා, වර්ණය, ප්‍රමාණය

4. **වැඩි දියුණු කළ නිෂ්පාදිතය**
ගනුදෙනුකරු අපේක්ෂා කරන මට්ටමටත් වඩා, ඉන් ඔබ්බට භාණ්ඩය සංවර්ධනය කර ඉදිරිපත් කිරීමයි. මින් පාරිභෝගිකයා අමන්දානන්දයට පත් වේ.
උදා :- නව තාක්ෂණික උපාංග හා පහසුකම් එකතු කිරීම.

5. **විභව නිෂ්පාදිතය**

සියලු සංවර්ධන මට්ටම් සහ වෙනස්වීම් සහිත ව අනාගත වෙළෙඳපොළට පිවිසීමේ මට්ටමයි.

උදා :- නිර්මාණාත්මක අදහසක් ඉදිරිපත් කර තිබිය හැකි ය.

(ii) (අ) 1. තාක්ෂණික යෝග්‍යතාව පිළිබඳ ව 2. රසායනික ප්‍රතික්‍රියා පිළිබඳ ව 3. ශක්තිමත් බව
4. නිෂ්පාදිතයේ ස්වභාවය පිළිබඳ ව 5. කල් පැවැත්ම පිළිබඳ ව 6. ප්‍රවාහන හැකියාව පිළිබඳ ව
7. පරිසරයට සහරාත්මු දෙන බව පිළිබඳ ව 8. වර්ණය හා කියවීමේ හැකියාව පිළිබඳ ව
9. සිල්ලර අලෙවිකරුවන් හා පාරිභෝගික ආකල්ප පිළිබඳ ව

(ආ) 1. අවම වශයෙන් දෙපාර්ශ්වයක් සිටිය යුතු වීම.
2. එක් එක් පාර්ශ්ව සතු ව අනෙක් පාර්ශ්වයට පිරිනැමීමට වටිනාකමක් ඇති යමක් තිබිය යුතු වීම.
3. එක් එක් පාර්ශ්ව අතර අදහස් හුවමාරුවට හා බෙදා හැරීමට හැකියාව තිබිය යුතු වීම.
4. එකිනෙකා පාර්ශ්වයන්ට යමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නිදහස තිබිය යුතු වීම.
5. එක් එක් පාර්ශ්වය විසින් අනෙක් පාර්ශ්වය සමඟ ගනුදෙනු කිරීම යෝග්‍ය යැයි විශ්වාස කළ යුතු වීම.

(iii) (අ) **පෑන්** — **කාණ්ඩ නිෂ්පාදනය හෝ ප්‍රවාහ නිෂ්පාදනය**

වරකට එක සමාන භාණ්ඩ සමූහයක් නිපදවීමේ ක්‍රියාවලිය කාණ්ඩ නිෂ්පාදනයයි. ඒ අනුව ආයතනයක නම සඳහන් කර විශේෂ පෑන් නිෂ්පාදනයට විශේෂ ඇණවුමක් ලත් විට කාණ්ඩ නිෂ්පාදනය යොදාගත හැකි ය. නමුත් ප්‍රවාහ නිෂ්පාදනය යනු එක ම වර්ගයේ භාණ්ඩයක් අඛණ්ඩ ව පේළිය ව ගලා යන ආකාරයට විශාල ප්‍රමාණයකින් නිෂ්පාදනය කිරීමයි. ඒ අනුව වෙළෙඳපළ සඳහා පෑන් නිෂ්පාදනය කිරීමට මෙම ක්‍රමය යොදාගත හැකි ය.

**ඇස් කණ්ණාඩි** — **කාර්ය නිෂ්පාදනය / ඇණවුමට නිෂ්පාදනය**

ගනුදෙනුකරුවෙකුගේ නිශ්චිත ඇණවුමක් මත ම භාණ්ඩ නිපදවීම කාර්ය නිෂ්පාදනය වේ. ඇස් කණ්ණාඩි නිපදවිය යුත්තේ, ඒ ඒ ගනුදෙනුකරුගේ ඇස් පරීක්ෂා කර බලා අදාළ ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි ය. එමනිසා මෙම ක්‍රමය ගැළපේ.

(ආ) 1. නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය 2. යන්ත්‍රවල තමාගිලි භාවිතය 3. ආකර්ශනීය බව
4. නිෂ්පාදන ශිල්පීය ක්‍රමය 5. අධීක්ෂණය කිරීමේ පහසුව 6. නීතිමය තත්ත්වයන්
7. ගනුදෙනුකරුවන් හා සේවකයින්ට අවශ්‍ය වන ඉඩකඩ
8. ගනුදෙනුකරුවන් නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධවීමේ තරම

(iv) 1. නිෂ්පාදිත විවිධාංගීකරණය
2. නිෂ්පාදිතය වැඩි දියුණු කිරීම.
3. ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රියාමාර්ග වෙනස් කිරීම.
4. මහජන සම්බන්ධතා වැඩි දියුණු කිරීම.
5. සෘජු අලෙවිකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
6. පිරිවැය අඩු කිරීමේ ක්‍රම භාවිත කිරීම.
7. අපතේ යාම් අවම කිරීම සඳහා ක්‍රම අනුගමනය කිරීම.
8. ඵලදායිතාවය වැඩි කිරීම.

(v)

| අරමුදල් සම්පාදන මාර්ගය | වාසි | අවාසි |
|---|---|---|
| 1. කොටස් නිකුත් කිරීම. | විශාල ප්‍රාග්ධනයක් රැස් කළ හැකි වීම.<br>ආපසු ගෙවීමේ අවදානමක් නොමැති වීම. | විශාල කාලයක් ගත වීම.<br>අයිතිකරුවන් වැඩි වීම. |
| 2. ණයකර නිකුතුව | ඉක්මනින් ලබා ගත හැකි වීම.<br>ආපසු ගෙවා නිදහස් කළ හැකි වීම.<br>පොලිය නිශ්චිත වීම. | ආපසු ගෙවීමේ අවදානමක් තිබීම.<br>වත්කම් ඇප තැබීමට සිදු වීම.<br>ස්ථිර පොලියක් ගෙවීමට සිදු වීම. |
| 3. බැංකු ණය | මුලික පිරිවැය ස්වල්ප වීම.<br>ඉක්මනින් ලබාගත හැකි වීම. | වත්කම් ඇප තැබීමට සිදු වීම.<br>කොන්දේසිවලට යටත් වීමට සිදු වීම.<br>පරිපාලනයට බලපෑම් ඇති වීම. |
| 4. කල්බදු | ආරම්භක ප්‍රාග්ධන ගැලපුම අවම වීම.<br>විශාල වටිනාකම් සහිත වත්කම් කුඩා වාරියක් ගෙවා පරිහරණය කළ හැකි වීම. | බාහිර බැඳීම්වලට යටත් වීම.<br>වාරික ගෙවා ගත නොහැකි වුවහොත් වත්කම් අහිමි වීම. |
| 5. වාණිජ පත්‍රිකා | කෙටිකාලීන බැඳීම් ඇති වීම.<br>කොටස් වෙළෙඳපළේ අලෙවි කළ හැකි වීම.<br>අතරමැදියන්ගෙන් තොර ව ලබාගත හැකි වීම. | ඉක්මනින් ගෙවා නිදහස් කළ යුතු වීම.<br>කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ යාම. |

08. (i) **වාසි**

1. පිරිවැය අඩු වීම.
2. වේගවත් ක්‍රමයක් වීම.
3. වාර්තා සකස් කිරීම පහසු වීම.
4. ගබඩා කර තබා ගැනීම පහසු වීම.
5. අයදුම්පත් විශාල ප්‍රමාණයක් ලබාගත හැකි වීම.
6. සන්සන්දනය කිරීම පහසු වීම.
7. යෝග්‍ය අයදුම්කරුවන් හඳුනා ගැනීම පහසු වීම.

**අවාසි**

1. අනවශ්‍ය ලෙස අයදුම්පත් විශාල ප්‍රමාණයක් ලැබීම.
2. අයදුම්කරුවන්ගේ සමහර හැකියාවන් (අත්අකුරු වැනි) මැනිය නොහැකි වීම.
3. සමහර සුදුසු පුද්ගලයින්ට අන්තර්ජාල පහසුකම් නොමැති නිසා අයදුම්පත් ඉදිරිපත් කළ නොහැකි වීම.
4. තාක්ෂණික දෝෂ ඇති විය හැකි වීම.

(ii) 1. පරිවාස කාලය දීර්ඝ කිරීම. 2. වාචික ව අවවාද කිරීම. 3. ලිඛිත ව අවවාද කිරීම.
4. පුහුණුව සඳහා යොමු කිරීම. 5. වෙනත් අංශයකට මාරු කිරීම. 6. සේවයෙන් ඉවත් කිරීම.

(iii) (අ) 1. අනුමත පුද්ගලයින්ට පමණක් පද්ධතියට ඇතුල්වීමට අවසර දීම.
2. Pass word - මුර පද (ඇඟිල් පද) භාවිත කිරීම.
3. Fire walls - ගිනි පවුර යොදා ගැනීම.
4. Anti virus - ප්‍රති වෛරස් යොදා ගැනීම.
5. Backup - උපස්ථ යොදා ගැනීම.
6. ප්‍රතිපත්ති හා උපදෙස් සැකසීම.
7. පුහුණු කිරීම

(ආ)

| දත්ත | තොරතුරු |
|---|---|
| 1. සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන මූලික දෑ වේ. | 1. දත්ත සැකසීමේ ක්‍රියාවලියෙන් බිහි වන ප්‍රතිදානය වේ. |
| 2. තීරණ ගැනීමට සෘජු ව ම භාවිත කළ නොහැකි ය. | 2. තීරණ ගැනීමට සෘජු ව ම භාවිත කළ හැකි ය. |
| 3. දත්ත වශයෙන් පවතින තෙක් අර්ථභාවයක් ගෙන නොදේ. | 3. අර්ථභාවයක් ඇත. |
| 4. අමුද්‍රව්‍යයකි යෙදවුමකි. | 4. නිමි ද්‍රව්‍යයකි නිමැවුමකි. |
| 5. දත්ත ප්‍රාථමිකයි. | 5. තොරතුරු ද්විතීයිකයි. |

(iv) 1. **නිෂ්පාදන අංශය/ මෙහෙයුම් අංශය** } - ද්‍රව්‍ය ඇනවුම් කිරීමට
ද්‍රව්‍ය මිල දී ගැනීමට

2. **අලෙවිකරණ අංශය** - විකුණුම් ඇනවුම් ලබා ගැනීමට
මිල කිරීමට

3. **මූල්‍ය ගිණුම් අංශය** - අය වැය ලේඛන සැකසීමට
පොදු ලෙජරය පිළියෙළ කිරීමට
මුදල් ගෙවීම් කිරීමට

4. **මානව සම්පත් අංශය** - සේවක පැමිණීම වාර්තා කිරීමට
වැටුප් වාර්තා සකස් කිරීමට
පුහුණුව හා සංවර්ධනයට

(v) (අ) 1. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මග පෙන්වීමට
2. ව්‍යාපාර කෙරෙහි ඇල්ම ඇති පාර්ශ්වයන්ට ව්‍යාපාරය පිළිබඳ ව අවබෝධයක් ලබා දීමට
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට

(ආ) 1. ඉදිරි මෙහෙයුම් කටයුතු පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාගත හැකි වීම.
2. නිෂ්පාදන කාර්යයේ දී ඇති වන අපතේ යාම, ප්‍රමාද වීම, අවම කරගත හැකි වීම.
3. නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නංවා ගත හැකි වීම.
4. නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩ ව පවත්වාගෙන යා හැකි වීම.
5. කටයුතුවලට අදාළ සම්පත් ප්‍රතිපාදනයට

******

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

**විද්‍යා - ගණිත**

- 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- 12-13 රසායන විද්‍යාව - 1
- 12-13 රසායන විද්‍යාව - 2
- 12-13 රසායන විද්‍යාව - 3
- 12-13 රසායන විද්‍යාව - 4
- 12-13 රසායන විද්‍යාව - 5
- 12-13 භෞතික විද්‍යාව - 1
- 12-13 භෞතික විද්‍යාව - 2
- 12-13 භෞතික විද්‍යාව - 3
- 12-13 භෞතික විද්‍යාව - 4
- 12-13 භෞතික විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 1
- 12-13 ජීව විද්‍යාව - 2
- 12-13 ජීව විද්‍යාව - 3
- 12-13 ජීව විද්‍යාව - 4
- 12-13 ජීව විද්‍යාව - 5
- 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- 12-13 කෘෂි විද්‍යාව - 1
- 12-13 කෘෂි විද්‍යාව - 2
- 12-13 කෘෂි විද්‍යාව - 3
- 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- 12 ගිණුම්කරණය
- 13 ගිණුම්කරණය
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 13 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව
- 13 ආර්ථික විද්‍යාව - 1
- 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- 12 සිංහල
- 13 සිංහල
- 12 දේශපාලන විද්‍යාව
- 13 දේශපාලන විද්‍යාව
- 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- 12 ඉන්දියානු ඉතිහාසය
- 13 ඉන්දියානු ඉතිහාසය
- 12 භූගෝල විද්‍යාව
- 13 භූගෝල විද්‍යාව
- 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes

**English Medium**

- 12 Accounting
- 13 Accounting
- 12 Business Studies
- 13 Business Studies
- 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සාමාන්‍ය දැනීම
- 12 ගිණුම්කරණය - 1
- 12 ව්‍යාපාර අධ්‍යයනය
- 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.